# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2284/11 - 2022 ජූනි මස 15 වැනි බදාදා - 2022.06.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ වන මා විසින් (393 වන අධිකාරය වූ) පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 2 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාර 2021 ජනවාරි මස 21 වන දින අංක 2211/55 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයෙන් 2021 ජනවාරි මස 20 වන දින පිහිටුවන ලද "මානව හිමිකම් සම්බන්ධයෙන් පූර්වගාමී කොමිෂන් සභාවන්හි හා කමිටුවල තීරණ ඇගයීම සහ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා වන ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවෙහි" තත් කාර්යයන් ඉටුකර එහි අවසන් වාර්තාව ඉදිරිපත් කළ යුතු වන්නාවූ 2021 ජූලි මස 21 වන දිනෙන් අවසන් වන කාලය, එකී පනතෙහි 4 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2021 ජූලි මස 27 වන දින අංක 2238/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කෙරුණු නිවේදනයක් මඟින් 2021 ජූලි මස 21 වන දින සිට මාස හයකින්, එනම් 2022 ජනවාරි මස 21 වන දින දක්වා දීර්ඝ කරන ලදුව, නැවත වතාවක් එකී බලතල ප්‍රකාරවම, 2022 ජනවාරි මස 18 වන දින අංක 2263/4 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කෙරුණු නිවේදනයක් මඟින් 2022 ජනවාරි මස 21 වන දින සිට 2022 ජූනි මස 21 වන දින දක්වා දීර්ඝ කරන ලදුව, නැවත වතාවක් එකී බලතල ප්‍රකාරවම 2022 සැප්තැම්බර් මස 21 වන දින දක්වා මෙයින් දීර්ඝ කරමි.

ගෝඨාභය රාජපක්ෂ

ගෝඨාභය රාජපක්ෂ,
ජනාධිපති.

2022 ජූනි මස 10 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේදී ය.

EOG 06-0017

1A - G 36939 — 366 (2022/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*